නිපුණතා මට්ටම:- 8.1 - ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්ථාර කරයි.

⋆ පහත කියවීම් පත්‍රිකාවේ සඳහන් ක්‍රියාකාරකම් පියවරෙන් පියවර සිදු කරන්න.

සමග්‍රහ / අවග්‍රහ / විෂමග්‍රහ සහිත ගී පද ප්‍රස්ථාර කිරීම පිළිබඳව අවබෝධ කර ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිතය. 07 ශ්‍රේණියේ දී ඔබ උගත් ප්‍රස්ථාරකරණයේ විශේෂිත අවස්ථා පිළිබඳ පාඩම නැවත කියවා ඔබගේ පෙර දැනුම සිහිපත් කර ගන්න.

පළමුව ගීතය ගයමින් හෝ අසමින් අත්පුඩි ගසන්න. මාත්‍රා තුනෙන් තුනට / හතරෙන් හතරට/ දාදරා , කෙහෙර්වා, ඛෙම්ටො, ජප්, දීප්චන්දි ආදී වශයෙන් කුමන තාලයට අයත් ගීතයක්දැයි හඳුනාගන්න.දෙවන පියවර වශයෙන් එම ගීතය ම නැවත ගයමින් හෝ අසමින් ගීතයේ පළමු අක්ෂරය හෝ දෙක අත්පුඩිය සමග එකවර ගායනය ආරම්භ වන්නේ ද , ගායනයට පෙර අත්පුඩිය ගසන්නේ ද , ගායනයට පසුව අත්පුඩිය වයන්නේ දැයි සොයා ගන්න. ප්‍රස්ථාර කිරීම ආරම්භ කිරීමේ දී මාත්‍රා අනුව විභාග බෙදා පළමු විභාගයේ පළමු මාත්‍රාව මත ගී පදයේ පළමු අකුර යෙදීම පහත ආකාර තුනෙන් කුමකට අයත් දැයි වටහාගෙන උදාහරණ අවබෝධ කරගනිමින් ප්‍රස්ථාර කරන්න.

<u>තාලයත් ගීතයත් එකවර ආරම්භ වීම</u> සමග්‍රහය ලෙස හඳුන්වයි.

අත්පුඩිය → **X**

තාලයට පසු ගීතය ආරම්භ වීම අවග්‍රහය ලෙස හඳුන්වයි.

තාලය	1	2	3	4	5	6	7	8	9	10	11	12
ගීතය 1	එ	ක	ට	ස	තු	ටු	සා	S	ග	රේ	S	S
ගීතය 2	+	දව	ස	ක්	පැ	ළ	නැ	ති	හේ	S	නේ	S
ගීතය 3	දු ර	පෙ	නෙ	න	තැ	නි	ත	ලා	S	S	+	අ	නු

තාලයට පෙර ගීතය ආරම්භ වීම විෂමග්‍රහය ලෙස හඳුන්වයි.

තාලය	1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16
සමග්‍රහ	ක	දු	පෙ	ළ	අ	ත	රේ	S	තු	රු	ව	දු	ලේ	S	S	S
අවග්‍රහ	+	+	ද	න්	නෝ	S	බු	S	දු	න්	S	S	ගේ	S	S	S
විෂමග්‍රහ + + හෙ ළ	ජා	S	ති	ක	අ	භි	මා	S	නේ	S	S	S	S	S	වැ	ඩු

❖ පහත ගීත පේළි සමග්‍රහ/අවග්‍රහ/විෂමග්‍රහ වශයෙන් නම් කර නියමිත තාල ,මාත්‍රා අනුව ප්‍රස්ථාර කරන්න.

1.දියගොඩ සැමතැන කිරිඉතිරේ
2.ඇහැළ මලින් ගස් පිරිලා
3.සැලළිහිණි කොවුල්හඬ රැවිදෙන්නා
4.දකුණ නැගෙනහිර බටහිර උතුර ද
5.ඔබයි රම්‍ය සඳ කිරණ
6.දන්න වංහුං අප කන්නසාමි
7. ගුමු ගුමුව වදුලේ
8. වාසනා දිනේකි මේක
9. සුවඳ පද්ම ඕළු ආදි
10. මල් පිපෙයි දෙනෙත් ඇරෙයි
11. රන් මලක් ලෙස දෙව් බඹුන්
12 .ඉරෙන් හදෙන් එළිය අරන්